# දානමය පිංකමක් පවත්වන පිළිවෙල

දානමය පිංකමක් පවත්වන්නේ පින් රැස්කරගැනීමටත්, කුසල ධර්මයන් දියුණුකරගැනීමටත්ය. එම කුසල ධර්ම ශක්තිය මෙලොව යහපත පිණිසද, පරලොව සුගතිගාමී වීම පිණිසද පවතින්නේය. ඒ විතරක්ද නොව කෙලවර උතුම්වූ නිවන් අවබෝධ කරගැනීමට ද මෙය ඒකාන්තයෙන් ම උපකාර වන්නේය.

“දානය” යනු හිත පිරිසිදු කරගෙන කරන උතුම් පරිත්‍යාගයට කියන නමකි. එබැවින් මෙය ආර්‍ය උතුමන් විසින් ප්‍රශංසා කරන ලද ධර්මයකි. දානයකින් ලැබිය යුතු නියම ප්‍රතිඵල ලබන්නට නම් එය නිසියාකාරව කළයුතු ම වන්නේය. එමනිසා සැදැහැවත්තයන් විසින් දානමය පිංකමක් පරිපූර්ණව පවත්වන්නේ කෙසේද කියා හොඳින් දැනගෙන තිබිය යුතුය.
මේ සඳහා පහත සඳහන් කරුණු ටික දැනගෙන තිබීම ඉතා වැදගත්ය.

1 තමන් අවංකවම යම් සීලමය ප්‍රතිපත්තියක පිහිටා සිටීම
2 තමන් පූජාකරණ දානය පිළිගැනීමට සිල්වත් භික්ෂූන් ලැබීම
3 පූජාකරන්නට සූදානම් කරගත්ත දේවල් ධාර්මික විදියකින් සොයාගෙන තිබීම
4 දානය සම්බන්ධයෙන් තම හිත ප්‍රසන්න කරගැනීම
5 කර්ම විපාක පිළිබඳව හොඳින් දැනගෙන තිබීම සහ කර්ම ඵල විශ්වාසය

හිත ප්‍රසන්න කරගන්නවා කියන්නේ තමන් දෙන දානය සම්බන්ධයෙන් තුන්සිත පහදවා ගැනීමය. තුන් සිත යනු *පූර්ව චේතනාව, මුඤ්චන චේතනාව* සහ *අපර චේතනාවය.*

**පූර්ව චේතනාව**
කර්මය කර්ම ඵලය අදහා ගෙන දානය සූදානම් කිරීම. දානමය පින්කමකින් ලැබෙන ප්‍රතිඵල දැනගෙන තිබීම මේ සඳහා ඉතා උපකාර වන්නේය.

**මුඤ්චන චේතනාව**
තමන් සැදැහැයෙන් සකස් කරගත් දේ සතුටින් පූජාකරන වෙලාව මුඤ්චන චේතනා අවශ්ථාවය. මෙතෙක් තමන් මගේ කියා ලෝභ කර කර තිබුණු දෙයක් තමන්ගෙන් මිදී යන්නේය. ඒ සමගම එයට බැඳී තිබුණු ලෝභයද හිතින් ගැලවී යන්නේය. එය මුඤ්චනය හෙවත් මිදීමයි.

**අපර චේතනාව**
දානමය පිංකමට පසුව ඒ ගැන සිතා සතුටුවීම අපර චේතනා අවශ්ථාවය.

දානමය පිංකමක් සිදුකරන විට කිසිලෙසකින්වත් සිත නරක් කරගැනීම සුදුසු නැත. එය පිංකම අසාර්ථක වීමටද, ආනිසංශ අඩුවීමටද හේතුවන්නේය.

පූර්ව සූදානම් වීම:

- ස්වාමින් වහන්සේලාට වැඩහිඳීමට සුදුසු ආසන පැනවීම
- ආසන අසල තරමක උස මේසයක් තැබීම (සයිඩ් ටේබලයක් හෝ කුඩා බංකුවක්)
- වැඩහිඳින ආසන සහ මේසයට සුදු ඇතිරිලි දැමීම
- මේසය මත ඔරලෝසුවක් තැබීම සුදුසුය

පිරිත් කියවාගැනීමට අවශ්‍යනම්:

- පිරිත් කිරීම සඳහා පෙරාගත් පිරිසිදු පැන් භාජනයක් සූදානම් කර තැබීම
- එය සුදු ලේන්සුවකින් හෝ එවැනි රෙදිකඩකින් වැසීම

ස්වාමීන් වහන්සේලාගේ පා සොදා ගෙතුලට වැඩම කරවීම:

- වතුර බේසමක් සහ කෝප්පයක් සූදානම් කර තැබීම
- පා පිසදැමීම සඳහා තුවායක් තැබීම
- නිවැසියන් විසින් ස්වාමීන් වහන්සේලාට වන්දනා කොට පිළිගැනීම
  ආසනවල වැඩ හිඳින්නට සැළැස්වීම.

බුද්ධ පූජාවට අවශයය පිළිවෙල:

- බුද්ධ පූජාව සඳහා උස මේසයක් හෝ තැනක් පිළියෙල කිරීම
- ඒ මත බුදු පිළිමයක් හෝ පින්තූරයක් තැබීම
- මල් වට්ටි පිළියෙල කිරීම
- පහන් සකස්කිරීම
- සුවඳ දුම් සකස්කර ගැනීම
- බුද්ධ පූජාව සඳහා කුඩා භාජන පිළියෙල කරගැනීම
  (ආහාර-පැන් ආදිය සඳහා)
- බුද්ධ පූජාව බෙදීම
- පැමිණ සිටින සැම දෙනාටම බුද්ධපූජාව අතගස්සවා ආසනය මත තැන්පත් කිරීම

සියලු දෙනාම වාඩිවී පන්සිල් සමාදන් වීමට සූදානම්වීම:

- පන්සිල් සමාදන් වීමට ආරාධනා වාක්‍ය කීම.
- පන්සිල් සමාදන් වීම.
- බුද්ධ පූජාව පූජාකිරීම.
- ස්වාමීන් වහන්සේ විසින් පිංකම පිළිබඳව අනුශාසනාවක් පැවැත්වීම.
- සාංඝිකව පූජාකිරීමට යමක් ඇත්නම් ඒවා සාංඝික කොට පූජාකිරීම.

ස්වාමීන් වහන්සේලාට දානය පිළිගැන්වීම:

- අත සේදීමට සහ පාත්‍රා සේදීමට පැන් පිළිගැන්වීම
- දානය බෙදීම (බත් ව්‍යඤ්ජන ආදි ප්‍රධාන ආහාර)
- දානය වැළඳූ පසු අත සේදීමට නැවත පැන් පිළිගැන්වීම
- අතුරුපස කැවිලි පෙවිල පළතුරු (ඇත්නම්) පූජාකිරීම

(දානය වළඳනවිට ස්වාමීන් වහන්සේලා සමග නොයෙක් මාතෘකාවන් යටතේ කතාකිරීම සුදුසු නැතිබව කරුණාවෙන් සළකන්න. දානය වළඳනවිට කතානොකිරීමට විනය ශික්ෂාපදයක්ද පනවා ඇත)

- පිරිකර ආදි යමක් ඇත්නම් ඒවා ස්වාමීන් වහන්සේලාගේ අතට පූජාකිරීම.
- සියලු දෙනාම සුදුසු පරිදි වාඩිවීම.
- ස්වාමීන් වහන්සේ නමක් විසින් පිරිසට අනුමෝදනා ධර්මදේශනාවක් පැවැත්වීම.
- අවසානයේදී දායක පිරිද පැන් වඩා ඥාතීන්ට දෙවියන්ට පිංපෙත් පැමිණවීම.
- ප්‍රාර්ථනා පිහිටුවා ගැනීම

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා
සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා

ධම්ම ගවේසී භාවනා මධ්‍යස්ථානය
වෙලින්ටන්